# ආගමන සමයේ දෙවන සතිය
## සඳුදා

**පළමුවන කියැවීම** — යෙසායා 35:1–10

යෙසායා දිවැසිවරායාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.

*දෙවියන් වහන්සේ ම ඔබ ගළවා ගැන්ම සඳහා වඩින සේක.*

වනය ද වියළි දේශය ද ප්‍රීති වන්නෝ ය. කාන්තාරය ප්‍රීතිමත් වී සෙව්වන්දි මෙන් දරන්නේ ය. එය ප්‍රීතියෙන් ගී හඬ නගන්නේ ය. ලෙබනොන් කන්ද මෙන් එය පියකරු වන්නේ ය. කර්මෙල් හා ශාරොන් කෙත් මෙන් සාරවත් වන්නේ ය. සමිඳුන්ගේ තේජාලංකාරය ද එතුමන් ගේ මහ බල මහිමය ද සියල්ලෝ දකින්නෝ ය.

බෙලහීන අත් බලවත් කර වෙවුළන දණහිස් ශක්තිමත් කරන්න. බියසුළු ඇත්තන්ට මෙසේ කියන්න, "භය නොවී දිරි ගන්න. සමිඳාණෝ ඔබ මුදන පිණිසත් ඔබේ සතුරන් ගෙන් පළිගන්න පිණිසත් වඩින සේක." අන්ධයන්ගේ ඇස් පැහැදෙන්නේ ය. බිහිරන්ගේ කන් ඇරෙන්නේ ය. කොර අය මුවන් මෙන් දුව පනින්නෝ ය. ගොළු අය ප්‍රීතියෙන් ගී ගයන්නෝ ය. කාන්තාරයෙන් ජලධාරා ගලා එන්නෝ ය. මරුකතරෙන් ඇළ දොළවල් බිඳී එන්නේ ය. මිරිඟුව ජල පොකුණක් වෙයි. වියළි බිම උල්පත්වලින් පිරෙයි. සිවලුන් ලැගුම් ගත් පාළු පෙදෙස්වල බට පඳුරු හා පන් ගස් හට ගන්නේ ය. ශුද්ධවන්තකමේ මාර්ගය යන නමින් මහ මාවතක් එහි ඇති වේ. පව්ටුන්ට එහි ගමන් කළ නොහැකි ය. මෝඩයන්ට එහි සැරිසැරිය නොහැකි ය.

සිංහයෝ එහි නොවෙති. දරුණු මෘගයෝ එමගෙහි හමු නොවෙති. සමිඳුන් විසින් මුදා ගනු ලැබූ අය පමණක් එහි ගමන් ගනිති. ගැළැවීම ලැබූ අය සෝෂා පවත්වමින් සතුටු සිතින් පිනා යමින් ජෙරුසලමට පැමිණෙති. දුකින් හා දොම්නසින් මිදී සදහට ම ප්‍රීති වෙමින් ඔව්හු එහි වෙසෙති.

*දේව වචනය මෙසේ ය.*

| පිළිතුරු ගීය | ගීතාවලිය 85: 8–13 |
|---|---|

පිළිතුර: අපගේ දෙවිඳාණෝ අප මුදන පිණිස වඩින සේක.

ගීය: දෙවි සමිඳුන් වදාරණ වදනට සවන් දෙමි.
මන්ද, සිය සෙනඟට ද, සැදැහැවතුන්ට ද,
එතුමාණන් තුළ විශ්වාසය තබන අයට ද,
සමිඳාණෝ සාමදානය දීමට පොරොන්දු වූ සේක.
එතුමන් හට ගරු බිය පාන අයට ගැළැවීම ඉතා සමීපව ඇත්තේ ය.

සත්තටම එතුමාණන්ගේ මහිමාලංකාරය අප රටෙහි බබළන්නේ ය.
තිර පෙම සහ විශ්වාසවන්තකම හමු වන්නේ ය.
දැහැමි බව සහ සාමය වැළඳ ගන්නේ ය.
විශ්වාසවන්තකම මිහි තලයෙන් ඉහළට නගින්නේ ය.
දැහැමි බව සගලොවින් පහළට බසින්නේ ය.

සමිඳාණෝ අප සමෘද්ධිමත් කරන සේක.
අපේ දේශය එහි පලදාව නිපදවන්නේ ය.
දැහැමි බව එතුමන්ට පෙරටුව යන්නේ ය.
එතුමන්ගේ අඩිපාරේ සාමය වන්නේ ය.

## සුපුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
සමිඳුන්ගේ මඟ පිළියෙල කරන්න.
එතුමන් හට ඇද නැති මාවත් සාදන්න.
දෙවියන් වහන්සේ කෙරෙන් වන විමුක්ති මාර්ගය
සියලු සතුන් දකිනු ඇත්තේය!
ආලේලූයා!

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

*අද අපි පුදුම දේ දුටුවෙමු.*

එක් දිනක්, ජේසුස් වහන්සේ උගන්වමින් සිටිය දී ගලීලයේ සහ ජුදයේ සැම ගම්වලින් ද ජෙරුසලමෙන් ද ආ පරිසිවරු හා විනයධරයෝ එහි හිඳ ගෙන උන්හ. රෝගීන් සුව කිරීමේ දේවානුභාවය උන් වහන්සේට තිබිණ. එකල මිනිස්සු අංශභාග රෝගියෙකු යහනක තබා ගෙනාහ. ඔව්හු ඔහු ඇතුළට ගෙනවුත් උන් වහන්සේ ඉදිරියෙහි තබන්නට සෙවූ හ. එහෙත් සමූහයා නිසා ඇතුළට ගෙන යන්නට මගක් නොදැක පියස්සට නැගී සෙවිල්ල ඇර, ජේසුස් වහන්සේ ඉදිරියෙහි පිරිස මැදට මෙට්ටයක් සමග රෝගියා බැස්වූහ. උන් වහන්සේ ඔවුන්ගේ ශ්‍රද්ධාව දැක "මිත්‍රය, ඔබේ පව් ඔබට කමා කරන ලදැ" යි වදාළ සේක.

එවිට විනයධරයෝ ද පරිසිවරු ද, "දේවාපහාස වචන කියන මේ මිනිහා කවරෙක් ද? දෙවියන් වහන්සේට මිස පව් කමා කරන්නට පුළුවන් අන් කාටදැ" යි විවාද කරන්නට පටන් ගත්හ. ජේසුස් වහන්සේ ඔවුන්ගේ කල්පනා දැන ඔවුන්ට උත්තර දෙමින්, "ඔබේ සිත් තුළ මෙසේ විවාද කරන්නේ මන්ද? වඩා පහසු කොයි එක ද? ඔබේ පව් එබට කමා කරන ලදැ යි කීම ද, නැතහොත් නැගිට ඇවිදින්නැ යි කීම ද? එහෙත් පොළොවෙහි දී පව් කමා කරන්නට මනුෂ්‍ය පුත්‍රයාණන්ට බලය ඇති බව ඔබ දැන ගන්න පිණිස මම මෙය කරමි" යි කියා උන් වහන්සේ "මෙට්ටය රැගෙන යන්නැ යි මම ඔබට කියමි" යි අංශබාග රෝගියාට වදාළ සේක. එකෙණෙහි ම ඔහු ඔවුන් ඉදිරියෙහි නැගිට, තමා වැතිර හුන් මෙට්ටය රැගෙන, දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින් ගෙදර ගියේ ය. සියල්ලෝ ම විස්මිතව දෙවියන් වහන්සේ ට ප්‍රශංසා කරමින් බියෙන් ඇළලි, අද අපි හරි පුදුම දේ දුටුවෙමු" යි කීය

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචය මෙසේ ය*